සැ. යු. - 2015.06.12 වැනි දින පළ වූ අංක 1,919 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,920 - 2015 ජුනි මස 19 වැනි සිකුරාදා - 2015.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1038 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1038 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1043 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට්* පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජූලි මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට්* පත්‍රයේ දැන්වීම් 2015 ජුනි මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහාධිකරණය - යාපනය**

අධිකරණවල රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ ටෙන්ඩර් මගින් විකිණීම

පහත සඳහන් අධිකරණයන්හි රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත සඳහන් වාහන සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ. මීට අදාළ ටෙන්ඩර් ලියවිලි යාපනය මහාධිකරණය මගින් 2015.07.16 වැනි දින ප. ව. 2.30 දක්වා නිකුත් කරනු ලැබේ. මේ සඳහා ආපසු නොගෙවන රු. 100 ක පෝර්ම ගාස්තුවක් යාපනය මහාධිකරණ ගිණුම් ශාඛාවේ ගෙවා ලබා ගත හැක.

එකී වාහන අදාළ අධිකරණයන්හි රෙජිස්ට්‍රාර්වරුන් මගින් පරීක්ෂා කිරීමට හැකියාව ඇත. වාහන පිළිබඳ විස්තර සහ ආපසු ගෙවන ඇප තැන්පත් මුදල හා අනෙකුත් කොන්දේසි පහත පරිදි වේ.

| | *වාහන විස්තර* | *ආපසු ගෙවිය යුතු ඇප තැන්පත් මුදල* | *අධිකරණය* |
|---|---|---|---|
| 1. | Mahendra Maximo (Red Colour – Small) | 5,000 0 | District/Magistrate's Court, Kayts |
| 2. | Mahendra Maximo (White Colour – Small) | 5,000 0 | District/Magistrate's Court, Mallakam |
| 3. | Bajaj Auto Re 2 Stroke | 2,000 0 | District/Magistrate's Court, Mallakam |
| 4. | Bajaj Auto (AR 4 S Green) | 2,000 0 | Magistrate's Court, Chavakachcheri. |

ලියුම් කවරයක බහාලන ලද මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් ගරු "මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, යාපනය" යන ලිපිනය වෙත 2015.07.16 වැනි දින ප. ව. 3.30 ට පෙර ලැබිය හැකි පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ සෘජුවම හෝ ගෙනැවිත් මහාධිකරණ ගිණුම් ශාඛාවේ පිහිටි ටෙන්ඩර් පෙට්ටියට (Tender Box) දැමිය යුතු ය. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි "කුමන අධිකරණයේ කුමන වාහනය මිලදී ගැනීම සඳහා වූ ටෙන්ඩර් පත ද 2015" යනුවෙන් සඳහන් කළ යුතුයි.

කේ. සිවපාදසුන්දරම්,
සභාපති/මහාධිකරණ විනිසුරු.

මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව,
මහාධිකරණය,
යාපනය.

06-587

---

# රජයේ නොවන දැන්වීම්

**සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ මහජනතාව වෙත දැනුම් දීමයි**

පහත සඳහන් සීමාසහිත සමාගම 2007 දරන සමාගම් පනතේ 8 වන වගන්තිය ප්‍රතිපාදනයට අනුකූලව එහි නාමය 2015 මැයි මස 13 වැනි දා සිට බලපැවැත්වෙන අයුරින් වෙනස් කර ඇති බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමු.

කලින් ව්‍යවහාර කළ නම : ඒ ජේ එස් ඇපරල් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 4133
ලියාපදිංචි කාර්යාලය : පලුගහවෙල, කටුවැල්ලේගම 11526
සමාගමේ නව නම : කෝටාල්ඩ්ස් ක්ලෝතින් රාජාංගනය (පුද්ගලික) සමාගම.

එස්ජේ කෝර්පරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

4 වැනි මහල, අංක 2
කාසල් පටුමග,
කොළඹ 04.

06-456

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ අංක 09 (1) දරන වගන්තිය යටතේ සමාගමක් සංස්ථාගත කිරීම සම්බන්ධයෙන් වන දැන්වීමයි.

සමාගම සංස්ථාගත කළ නාමය : එරෙවුල හොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ අංකය : පීවී 105424
සංස්ථාගත කළ ලිපිනය : අංක 111, මීගමුව පාර, පෑලියගොඩ
සංස්ථාගත කළ දිනය : 2015.05.06

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

අංක : SEC/1/(b)(1)/2005/3215

06-458

### මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2008 සැප්තැම්බර් මස 23 වැනිදා ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ලිඩ්ස් මැන්පවර් සර්විසස් (පීවීටී) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 65611
ලියාපදිංචි කාර්යාලය : අංක 07, පළමු හා දෙවැනි මහල, ආනන්ද රාජකරුණා මාවත, පුංචි බොරැල්ල, කොළඹ 10.

රීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ්
සෙක්රටරීස් (පුද්ගලික සමාගම),
සමාගම් ලේකම්වරු.

අංක 2 ඒ 1/1, රංජන් පාර,
දුම්රියපොල පාරෙන් හැරී,
කොළඹ 06

06-460

---

### මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2008 සැප්තැම්බර් මස 17 වැනිදා ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ලීඩ්ස් ඉන්ටර්නැෂනල් මැන්පවර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 65566
ලියාපදිංචි කාර්යාලය : අංක 83, 84 සහ 85 පළමු මහල, මධ්‍යම බස් නැවතුම් සංකීර්ණය, පැරකුම්බා මාවත, කුරුණෑගල.

රීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ්
සෙක්රටරීස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

අංක 2 ඒ 1/1, රංජන් පාර,
දුම්රියපොල පාරෙන් හැරී,
කොළඹ 06.

06-461

---

### මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2008 සැප්තැම්බර් මස 24 වැනිදා ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ලිඩ්ස් එම්ප්ලෝමන්ට් ඒජන්සි (පීවීටී) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 65612
ලියාපදිංචි කාර්යාලය : අංක 51, පළමු මහල ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.

රීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ්
සෙක්රටරීස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

අංක 2 ඒ 1/1, රංජන් පාර,
දුම්රියපොල පාරෙන් හැරී,
කොළඹ 06

06-462

---

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙසේ නිවේදනය කරනු ලැබේ

සමාගමේ නම : ටැප්‍රොලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 68151
ලියාපදිංචි ලිපිනය : අංක 400, පහල ඉඹුල්ගොඩ, ඉඹුල්ගොඩ
සංස්ථාපනය කළ දිනය : 2009 ජූනි 17

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

06-487

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සණස ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2015ක් වූ අප්‍රේල් මස 28 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම සණස ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105285
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 1 බී, කැප්පෙටිපොල මාවත, කොළඹ 05

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතුව,

කෝ-සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

06-502

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ ඔරේන්ගෝ හොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2015ක් වූ මාර්තු මස 25 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ඔරේන්ගෝ හොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 104726
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 78, රොස්මෙඩ් පෙදෙස, කොළඹ 07.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව,

කෝ-සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

06-503

### දැන්වීමයි

2007 අංක 07 දරන පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : රූන්ගො ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105426
ලියාපදිංචි කාර්යාලය : අංක 53/8, නව දුම්රියපළ පාර, කොට්ටාව, පන්නිපිටිය.
ලියාපදිංචි කළ දිනය : 2015 මැයි 06

සමාගම් ලේකම්වරු.

06-527

### සමාගමක් සංස්ථාගත කිරීම

2007 අංක 07 දරන පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

සමාගමේ නම : යූ. එන්. කේ. ග්ලෝබල් මෙරිටයිම් ඉන්ස්ටිටියුට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 101717
සංස්ථාගත කළ දිනය : 2014.10.14
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 23 ඊ, පල්ලියවත්ත, හැඳල, වත්තල.

ආචාර්ය ජේ. එම්. ඩී. ආරියරත්න (වරලත් ගණකාධිකාරී),
සමාගමේ ලේකම්.

06-529

### නිවේදනයයි

හරුෂ් කෝපරේට් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2015 මැයි මස 26 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : හරුෂ් කෝපරේට් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105758
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 84, පළමු පටුමග, රත්මලාන.

සී. ජී. ජයවීර බණ්ඩාර,
සමාගම් ලේකම්.

06-536

### සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගම් නාමය : කොස්මෙටික්ස් මැනුෆැක්චර්ස් ඇසෝසියේෂන් ඔෆ් ශ්‍රී ලංකා
සමාගම් අංකය : ජී ඒ 2947 - 2014.08.08 වැනි දිනැති
සමාගමෙහි ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 45, බ්‍රේබෲක් වීදිය, කොළඹ 02

බිස්නස් මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරුන්.

අංක 45, බ්‍රේබෲක් වීදිය, කොළඹ 02.
2015 මැයි මස 18 වැනි දින.

06-538

### සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගම් නාමය : අයිලන්ඩ් ඇඩ්වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 105 410 - 2015.05.05 වැනි දින
සමාගමෙහි ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : තට්ටු නිවාස 28 - 3, එම්පයර් රෙසිඩන්සීස් අංක 51, බ්‍රේබෲක් පෙදෙස, කොළඹ 02.

බිස්නස් මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරුන්.

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.
2015 මැයි මස 18 වැනි දින.

06-539

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

ගාල්ල, උණවටුන, මැටරඹ, ශ්‍රී සුනන්දාරාමවාසී ඊපෝ මහින්දවංශ හිමි වන මවිසින් කරන්දෙණිය, දීනවල, "සේපාලි" අංක 3/1 දරන ස්ථානයෙහි පදිංචි මුණිදාසගේ ගාමිණී ජයලත් විමලසූරිය මාගේ ඇටෝර්නි බලකරු කරමින් ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් සමන් රේණුකා නාරංගොඩ මහත්මිය විසින් සැකසූ අංක 6318 හා 2013.12.27 දිනැති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර ඇති බැව් මෙමගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවට හා මහජනතාවට දන්වා සිටිමි.

ඊපෝ මහින්දවංශ හිමි.

06-549

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගිංතොට විදානෙගේ තිලක් රුවන් සමරතුංග වන මා විසින් වැලිවේරියේ ජුබිලි මාවතේ අංක 209/1 හි පදිංචි මාලිමගේ මධුෂා මිහිරානි ඩයස් යන අයට 2012 මාර්තු මස 17 වැනි දින ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඇම්. ආර්. ඇම්. බී. පෙරේරා මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 606 දරන ඇටෝර්නි බලපත්‍රය යටතේ මුදුන්ගොඩ දී අත්සන් කර ලබා දී ඇති ඇටෝර්නි බලපත්‍රය අහෝසි කොට අවලංගු කරන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

2015ක් වූ ජුනි මස 08 වැනි දින,
අංක 209/1, ජුබිලි මාවත,
වැලිවේරිය.

06-555

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ කලින් නම : බී. පී. එල්. ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 12485
සමාගමේ අලුත් නම : බොගවන්තලාව ටී මාර්කටිං (පීවීටී) එල්ටීඩී
සමාගමේ නම වෙනස් කළ දිනය : 2015.05.26
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : දෙවැන මහල, ඇන්ඩෘස් ගොඩනැගිල්ල, අංක 130, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

බොගවන්තලාව ටී මාර්කටිං (පීවීටී) එල්ටීඩී සඳහා සහ වෙනුවෙන්,

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2015 මැයි මස 28 වැනි දින.

06-556

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු :-

සමාගමේ කලින් නම : පී සී එච් හෝල්ඩිංස් පීඑල්සී
සමාගමේ අංකය : පීවී/පීබී 10527/පී ක්‍යු
සමාගමේ අලුත් නම : ඇඩම් කැපිටල් පීඑල්සී
සමාගමේ නම වෙනස් කළ දිනය : 2015.05.26
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 264, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14.

ඇඩම් කැපිටල් පීඑල්සී සමාගම සඳහා සහ වෙනුවෙන්,

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2015 මැයි මස 28 වැනි දින.

06-557

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : එස් එස් ඩී කුකින් ඉක්විප්මන්ට් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 105254
ලිපිනය : අංක 35, ජා-ඇල පාර, ගම්පහ
සංස්ථාගත දිනය : 2015.04.27

06-559

---

## සීමිත වගකීම් සහිත සමාගමක ප්‍රකාශිත ප්‍රාග්ධනය අවකරණය පිළිබඳ මහජන දැන්වීමයි

2007 වසරේ අංක 7 දරන සමාගම් පනතේ 59 (2) දරන වගන්තියේ නියමයන්ට අනුකූලව 2015 ජනවාරි මස 01 වැනි දින සිට බලපවත්වන පරිදි ප්‍රාග්ධන අවකරණය වීම පිළිබඳව මහජන දැන්වීම 2014 නොවැම්බර් මස 07 වැනි දින නිවේදනයක් නිකුත් කරන ලදී. එනමුත් මෙම ආයෝජන කලඹය පැවරීම සඳහා අවශ්‍ය වන්නාවූ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ නිරීක්ෂණයන් සහ උසාවි නියෝගයක් ලබා ගැනීමට බලාපොරොත්තු වූවාට වඩා කාලයක් ගත වූ බැවින් ප්‍රාග්ධනය අවකරණය සිදුවීමට නියමිතව තිබූ දිනය මතු යම් දිනයකට කල්තැබීමට සමාගමට සිදු වී ඇත.

එහෙයින් මෙම නිවේදනය කරනු ලබනුයේ අදාල රෙගුලාසිවලට අනුකූලව අවශ්‍ය අනුමැතියන් ලබා ගත් පසු දිනයක ප්‍රාග්ධනය අවකරණය සිදුකරනු ලබන බව දැනුම්දීමටය.

තව ද, මීට පෙර පළ කරනු ලැබූ දැන්වීමේ සඳහන් කොට තිබූ අවකරණයට පෙර ප්‍රාග්ධනය රුපියල් 1,000,000,000 සිට රුපියල් 1,100,000,000 දක්වා වර්ධනය වී ඇති බව මෙමගින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව ප්‍රාග්ධන අවකරණය පිළිබඳ දැනට පවත්නා තොරතුරු පහත දැක්වේ:-

සමාගමේ නම : සීමාසහිත එල්. ඕ. එල්. සී. ඉන්ෂුවරන්ස් සමාගම
සමාගමේ අංකය : පී. බී. 3807
අවකරණයට පෙර ප්‍රකාශිත ප්‍රාග්ධනය : රු. 1,100,000,000
අවකරණයෙන් පසු ප්‍රකාශිත ප්‍රාග්ධනය : රු. 600,000,000

2011 වසරේ අංක 3 දරන සංශෝධිත සහිත 2000 වසරේ අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතේ රෙගුලාසි සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය මගින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව සංයුක්ත රක්ෂණ සමාගමක් මගින් රක්ෂණ ව්‍යාපාරයක් ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ලෙස විසංගමනය කිරීම සඳහා මෙම ප්‍රාග්ධනය අවකරණය සිදු කරනු ලබයි.

සීමාසහිත එල්. ඕ. එල්. සී. ඉන්ෂුවරන්ස් සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එල්. ඕ. එල්. සී. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

2015 මැයි මස 27 වැනි දින,
අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

06-561

## ඇටෝර්නි බලය අවලංගු කිරීම පිළිබඳ දැන්වීමයි

කැලණිය, දලුගම, රාමසිංහ මාවත අංක 56/1 ඒ හි පදිංචිය හිමි දොන් ක්‍රිස්ටෝපර් හෙට්ටිආරච්චි සහ මංගලිකා හෙට්ටිආරච්චි වන අප විසින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ජයප්‍රේම බී තෙන්නකෝන් මහතා විසින් අංක 3319 යටතේ වර්ෂ 2006.09.16 වැනි දින ලියා සහතික කරන ලද කුරුණෑගල රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඇටෝර්නි බලපත්‍ර පොතේ අංක 13, කාණ්ඩයේ 783, පත් ඉරුවේ අංක 1109 දරන දින පොතේ අංකය යටතේ වර්ෂ 2006.09.26 වැනි දින ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය 2015.05.28 වැනි දින සිට අවලංගු හා බල රහිත ශුන්‍ය ලේඛනයක් බව මෙයින් සියලු දෙනාගේ ම දැන ගැනීම පිණිස දන්වන අතර, එකී බලපත්‍රය යටතේ මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු වශයෙන් කුරුණෑගල තැපැල්, දකුණු රවුම් පාර, අංක 5/1 හි පිහිටි කලුතොට පිනැන්ෂියල් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් යන සමාගමට අප වෙනුවෙන් ක්‍රියා කිරීමට ලබාදී ඇත්තාවූ බලය වර්ෂ 2015.06.01 වැනි දින සිට අහෝසි වන බව සියලු දෙනාම මෙයින් දැන ගත යුතු වේ.

දොන් ක්‍රිස්ටෝපර් හෙට්ටිආරච්චි සහ මංගලිකා හෙට්ටිආරච්චි.

2015 ජුනි මස 01 වැනි දින.

06-564

## ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

ශ්‍රී ලංකාවේ, මන්නාරම, පෙටා, 2 වන හරස් වීදියේ හි පදිංචි මම අරුලම්පලම් මනෝහරන් හා මාගේ බිරිඳ වන ක්‍රිෂාන්ති මන්ජුලා මනෝහරන් යන අය ශ්‍රී ලංකාවාසීන්ට දැනුම් දෙන වග නම් 2012.02.09 වැනි දින එම් එම් සබුරුඩීන් යන නොතාරිස් විසින් සහතික කරන ලද අංක 10869 දරන ඇටෝර්නි බලපත්‍රය මෙසේ අවලංගු කරනු ලැබේ.

එබැවින් 2012.02.09 වැනි දින එම්. එම්. සබුරුඩීන් යන නොතාරිස් විසින් සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍ර අංක 10869 මගින් බලය පවරන ලද ශ්‍රී ලංකාවේ, මන්නාරම, පෙටා, 2 වන හරස් වීදියේ හි පදිංචි සෑම රත්නරාජ් (ජා. හැ. අංක 400013578 වී) විසින් ගන්නා කිසිදු ක්‍රියාමාර්ගයකට 2015.06.03 දින සිට අප විසින් වග කියනු නොලබන බව මෙසේ දන්වා සිටිමු.

අරුලම්පලම් මනෝහරන් හා ක්‍රිෂාන්ති මන්ජුලා මනෝහරන්.

06-566

## දැන්වීමයි

2007 අංක 7 දරන නව සමාගම් පනතේ 9 වැනි වගන්තියේ (1) උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් මතු දැක්වෙන පරිදි සංස්ථාගත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | *සමාගමේ නම* | *සමාගමේ අංකය* | *ලියාපදිංචි දිනය* | *ලිපිනය* |
|---|---|---|---|---|
| 01. | නෙළුම් හොලිඩේස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | PV99503 | 2014.07.04 | අංක 31/6, පත්මසිරි පෙරේරා මාවත, මස්සල, බේරුවල. |
| 02. | ඇබ් ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් | PV98849 | 2014.05.29 | අක 294, උද්‍යාන පාර, කොළඹ 05. |
| 03. | එම්. කේ. ලංකා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් | PV98625 | 2014.05.19 | අංක 30/90 බී, ලොන්ඩන් පෙදෙස, කොළඹ 07 |
| 04. | සැන්ට්ලි කළම්බු ටෙස්ටිං සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් | PV97263 | 2014.02.25 | අංක 280/7, මීගමු පාර, වත්තල. |
| 05. | දෙව්මිනි අංජන ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ් | PV98223 | 2014.04.22 | අංක 109/1, ගනේගොඩ, දොම්පේ. |
| 06. | ග්‍රෝ ලංකා ඇග්‍රෝ සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | PV95712 | 2013.11.25 | අංක 280/7 මීගමු පාර, වත්තල. |
| 07. | ඊගන් වෙග් ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | PV100059 | 2014.08.04 | අංක 67/1/1 ගාලු පාර, දෙහිවල. |
| 08. | සමනල පැරඩයිස් රෙස්ටොරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | PV101168 | 2014.09.30 | අංක 293, නුවර පාර, ගාල හංදිය, කිරිබත්ගොඩ. |
| 09. | මීරියගල්ල ෆාම් (ප්‍රයිවට්) ලිමිටඩ් | PV101321 | 2014.10.07 | කැන්දබඩ, මිරියගල්ල, පාදුක්ක |
| 10. | ස්කයිලයින් ප්‍රොපර්ටි ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | PV103260 | 2015.01.20 | අංක 452/2 කෝට්ටේ පාර, පිටකෝට්ටේ. |
| 11. | හිමානි ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | PV103222 | 2015.01.20 | අංක 452/2, කෝට්ටේ පාර, පිටකෝට්ටේ |
| 12. | මුනියැක් (ප්‍රයිවට්) ලිමිටඩ් | PV104150 | 2015.02.27 | අංක 38, ඩින්ස්ටන් පෙදෙස, කොළඹ 03 |
| 13. | පවර් සොලුෂන්ස් සවුත් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ් | PV104510 | 2015.03.17 | අංක 279/2, හොකන්දර පාර, තලවතුගොඩ |
| 14. | ෆැන්ටාසියා සින්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් | PV97774 | 2014.03.24 | අංක 452/1, කෝට්ටේ පාර, පිටකෝට්ටේ |
| 15. | වයිල්ඩ් සිලෝන් ලක්ෂරි (ප්‍රයිවට්) ලිමිටඩ් | PV103206 | 2015.01.06 | අංක 290/21 ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10. |

06-505

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී
(කලින් සී/ස ඩීඑෆ්සීසී වර්ධන බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් සහ යන්ත්‍ර සූත්‍ර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 240 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, හැඳල වත්තල ප්‍රාදේශීය සභා සීමාවට අයත් පල්ලියවත්ත පිහිටි, සිරිපිනවත්ත, බොරළුගහවත්ත සහ මිදෙල්ලගහවත්ත ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා විසින් සාදන ලද 1986 සැප්තැම්බර් මස 27 වැනි දිනැති අංක 561 දරන පිඹුරේ ලොට් අංක 06 සහ 07 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය ෑ අක්. 0, රූඩ් 01, පර්. 03 සහ අක්. 01, රූඩ් 01, පර්. 36.3 පිළිවෙලින් එහි පිහිටි පස, ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව ඉහත කී අංක 561 දරන ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

උකස්කරුට සහ ඔහුගේ අමුත්තන්, ඉංජිනේරුවන්, කොන්ත්‍රාත්කරුවන් ගෘහ නිර්මාණ ශිල්පීන් කුලී කරුවන්, සේවකයන්, බදුකරුවන්, බලපත්‍රලාභීන්, ආරාධිතයන් යන අයට සියලුම අවස්ථාවල සහ මින්මතුවට ඔවුන්ගේ කැමැත්ත සහ අවශ්‍යතාවට අනුව, ඕනෑම අරමුණක් සඳහා දිවා කාලයේ හෝ රාත්‍රි කාලයේ යාමට ඒමට පසු කිරීමට ඇවිදීමින් හෝ වෙනයම් ආකාරයකින් ඔවුන්ගේ අශ්වයන්, ගවයන් හෝ වෙනත් සතුන් මගින් හෝ මෝටර් කාර්රථ ලොරි රථ මගින් හෝ වෙනත් වාහනයකින් මගින් බර පැටවූ හෝ බර නොපටවා පාර දිගේ හෝ පාර මතින් මෙහි විශේෂයෙන් විස්තර කර ඇති සහ එක් ආකාරයක හෝ සියලුම ආකාරයේ අයිතීන් දිශාවන් වාසීන් සහ අනුබැඳි දේපළ හෝ සාමාන්‍ය පරිභෝජනයේ දී භාවිතා වන සතු කරගන්නා සියළුම අයිතීන් සඳහා සම්පූර්ණ සහ නිදහස් අයිතියක් ඇති අතර, එම කොටසේ විදුලි කේබල් ඇදීමට ඉහලින් යන වයර් ඇදීමට ජලාපවහන සහ ගෑස් හෝ නළ ජලය සඳහා අදාළ කොටස් සවිකිරීමට සහ වෙනත් ඕනෑම ආකාරයක ක්‍රියාවක් හෝ ඒ සඳහා උත්සාහයට සම්පූර්ණ අයිතියක් ඇත.

ඉහත කී පල්ලියවත්ත පිහිටි, සිරිපිනවත්ත, බොරළුගහවත්ත සහ මිදෙල්ගහවත්ත ලෙස හැඳින්වෙන අංක 561 දරන පිඹුරේ (මාර්ග සඳහා වෙන් කිරීම) ලොට් අංක 01 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය ෑ අක්. 0 රූඩ් 02, පර්. 8.6

එහි පිහිටි පස, ගස්වැල් වගාවන් සහ සියල්ල සහිතව ඉහත කී අංක 561 දරන ඉඩම් කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී පල්ලියවත්ත පිහිටි, ගොරකගහවත්ත හෙවත් කෝන්ගහවත්ත සහ කුරුදුගහකුඹුර ලෙස හැඳින්වෙන අංක 561 දරන පිඹුරේ (මාර්ගය සඳහා වෙන් කිරීම) ලොට් අංක 09 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය අක්. 0, රූඩ් 0, පර්. 29.3

එහි පිහිටි පස, ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව ඉහත කී අංක 561 දරන ඉඩම් කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

පහත දැක්වෙන යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ඇතුලුව ෑ-

1. වර්ටිකල් ටෙම්පරින්ග් ප්ලාන්ට් - ඉන්දියාව
2. ස්ට්‍රේට් ලයින් එඩ්ජ් වර්කින් මැෂින් - බර්ලයින් බෙයිලි ඇන්ඩ් කම්පනි ලිමිටඩ් මැන්චෙස්ටර් යූකේ
3. අප්රයිට් හැන්ඩ් ගයින්ඩර් - බර්ලයින් බෙයිලි ඇන්ඩ් කම්පනි ලිමිටඩ් මැන්චෙස්ටර් යූකේ
4. 500KW ඩෝමන් ජෙනරේටර් 12 සිලින්ඩර් 1988 මොඩල් යූකේ
5. හොරිසන්ටල් ෆර්නන්ස් 19 මොඩල් ජර්මනි
6. DCM 2 1/2 ටොන් ෆෝක් ලිෆ්ට් - ඩීසල් ජපානය
7. ටොයොටා 2 ටොන් ෆෝක් ලිෆ්ට් - පෙට්‍රල් ජපානය
8. කොමට්සු බැකෝ පී සී 10 - ඩීසල් විත් බ්‍රේකර් ජපානය
9. ජේ එස් සීරිස් හොරිසන්ටල් රෝලර් හීත් බෙන්ට් ග්ලාස් ටෙම්පරින්ග් ෆර්නන්ස් ලයින් මොඩල් ජේ එස් - බී ටී 243610 (49mm)
10. FSM 20/3, ග්ලාස් ස්ට්‍රේට් ලයින් ඩබල් එඩ්ජින් මැෂින්

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් K D A V විජේකෝන් විසින් සහතික කරන ලද 2008 ජනවාරි මස 31, 2008 පෙබරවාරි මස 05 සහ 2008 පෙබරවාරි 14 දිනැති අංක 240 දරන සමාගම් උකස්කරය ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ නීතිගත වූ සහ ලියාපදිංචි අංක පීවී 15774 දරන (කලින් අංකය N (PVS) 37763) එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ පිහිටි (මින්මතු සමාගම ලෙස හැඳින්වෙන) ඔරියන්ට් ගෝල්ඩ් ප්ලස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී (කලින් සී/ස ඩී එෆ් සී සී වර්ධන බැංකුව) ට උකස් කරන ලදුව, ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2015 ජූලි මස 07 වැනි දින (අඟහරුවාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2% ක (සියයට දෙකහමාර),
4. රු. 95,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝසකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකාර ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 123 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

06-463

---

**මහජන බැංකුව - මාදම්පේ ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වන වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කොට්ඨාසයට අයත්, උතුරු පිටිගල් කෝරළේ, යගම්පත්තුවේ හලාවත ප්‍රාදේශීය බල ප්‍රදේශයේ, මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, ඌරලියාගාර ග්‍රාමසේවක වසමට අයත්, ඌරලියාගාර නමැති ගමේ පිහිටි හංදිවත්ත හෙවත් බෝගහහන්දිය ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු එම්. එම්. පී. ඩංස්ටන් පෙරේරා විසින් සාදන ලද 2011 සැප්තැම්බර් මස 28 වැනි දිනැති අංක 8000 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූ. 0 පර්. 18.03 එහි පිහිටි ගස්වැල්, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සියල්ල සහිතව සහ හලාවත ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක R 103/42 යටතේ ලියාපදිංචි කර ඇත.

*දේපළ වෙත පිවිසීම.* - මාදම්පේ මහජන බැංකුවේ සිට නගර මධ්‍යයට පැමිණ දුම්රිය හරස් පාර පසුකර ඉදිරියට යන විට කුරුණෑගල පාර සහ මැදගම පාර බෙදීයන ස්ථානයේ එම පාරවල් දෙකට මායිම්ව මෙම දේපළ පිහිටා ඇත.

ඉහත කී ඌරලියාගාර ග්‍රාමයේ පිහිටි, කෝන්ගහවත්ත හෙවත් මාරගහවත්ත ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු, එම්. එම්. පී. ඩංස්ටන් පෙරේරා විසින් සාදන ලද 2011 මාර්තු මස 26 වැනි දිනැති අංක 7001 ඒ දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූ. 0 පර්. 06

එහි පිහිටි ගස්වැල්, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සියල්ල සහිතව සහ හලාවත ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක ආර් 103/43 යටතේ ලියාපදිංචි කර ඇත.

*දේපළ වෙත පිවිසීම.* - මාදම්පේ මහජන බැංකුවේ සිට නගර මධ්‍යයට පැමිණ දකුණු පැත්තට ඇති පැරණි මාදම්පේ නගරය දෙසට ඇති මාර්ගයට පිවිස මාර්ගයේ වම් පසින් සමූපකාර සමිති ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිරි පසින් රුවන් ස්ටෝර්ස් ව්‍යාපාරික ස්ථානය හමුවේ.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2015 ජූලි මස 09 වැනි බ්‍රහස්පතින්දා දින පිළිවෙලින් පෙ. ව. 11.00 සහ පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*තීරණය පිළිබඳ දැන්වීම.* - කරුණාකර 2014 ජනවාරි මස 10 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද*, 2013 දෙසැම්බර් මස 30 වැනි දින දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - එක් එක් වෙන්දේසිය අවසානයේ මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර)
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු,

ගැණුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමණාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය කාර්යාලය, මහජන බැංකු ගොඩනැගිල්ල, (පළමු මහල), අංක 79, මාරවිල පාර, නාත්තන්ඩිය වෙත ගෙවිය යුතු වේ.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

දුරකථන අංක 032 - 2253300, 032 - 2253301 ෆැක්ස් අංකය : 032 - 2255247.

ඔප්පු සහ අනෙකුත් ලියකියවිලිවල පිටපත් ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

"ඉහත වෙන්දේසි පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 123 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

06-507

---

## මහජන බැංකුව - පුත්තලම ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වන වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, පුත්තලම කඩවත් සතර තුළ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුත්තලම නගර සභා සීමාව තුළ තිල්අඩිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත්, පුත්තලම නගරයේ නින්දෙනිය නමැති ගමේ පිහිටි නින්දෙනිය කානි නමැති ඉඩමට ජේ. ඒ. වී. රාජනාගයම් බලයලත් මානක තැන විසින් 2001.11.23 ලෙස ලියාපදිංචි වී තිබුණ ද, අදාළ පිඹුර ප්‍රකාරව 2001.03.28 වැනි දින මැන සාදන ලද අංක 1495 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 04 දරන ඉඩම් කොටස.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 01 පර්. 08 ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සහිතව සහ පුත්තලම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඒ 04/171 යටතේ ලියාපදිංචි කර ඇත.

*දේපළ වෙත පිවිසීම.* - පුත්තලම සිට තිල්අඩිය පල්ලිය ඉදිරිපිට පාරේ ගොස් දකුණට හැරී කෝවිල අසල මෙම දේපළ පිහිටා ඇත.

02. ඉහත කී පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තිල්අඩිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත්, පුත්තලම නගරයේ තිල්අඩිය නමැති ගමේ පිහිටි තිල්අඩිය කානි නමැති ඉඩමට වී. ටී. බාලසුබ්‍රමනියම් බලයලත් මානක තැන විසින් 2000.10.29 වැනි දින මැන සාදන ලද අංක 1704 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන ඉඩම් කොටස.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූ. 0 පර්. 14.6 ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සහිතව සහ පුත්තලම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ A put/01/67 යටතේ ලියාපදිංචි කර ඇත.

*දේපළ වෙත පිවිසීම.* - පුත්තලම සිට නින්දෙනිය කුරුණෑගල පාරේ කිලෝමීටර් 01ක් පමණ ගොස් දකුණට හැරී නින්දෙනිය මාර්ගයේ මීටර් 600 පමණ යන විට ක්‍රිස්තියානි පල්ලිය හමුවේ. එම පල්ලියට පසුව මෙම දේපළ පිහිටා ඇත. මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2015 ජූලි 09 වැනි බ්‍රහස්පතින්දා දින පිළිවෙලින් ප. ව. 2.00 සහ ප. ව. 2.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*තීරණය පිළිබඳ දැන්වීම සඳහා.* - කරුණාකර 2015.02.27 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2015.02.13 වැනි දින දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් එක් එක් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර)
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු,

ගැණුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමණාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, මහජන බැංකු ගොඩනැගිල්ල, (පළමු මහල), අංක 79, මාරවිල පාර, නාත්තන්ඩිය වෙත ගෙවිය යුතු වේ.

දුරකථන අංක 032 - 2253300, 032 - 2253301
ෆැක්ස් අංකය : 032 - 2255247.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පිටපත් ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

"ඉහත වෙන්දේසි පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 123 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

06-508

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ටී. එම්. එස්. බණ්ඩා
ගිනුම් අංක : 0031 5001 0631.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2013 සැප්තැම්බර් මස 26 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තිස් හත් ලක්ෂ තිස් අට දහස් එකසිය හතලිස් එකයි ශත විසි තුනක (රු. 3,738,141.23) මුදල ද, 2013 අගෝස්තු මස 28 වැනි දින අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් හතර ලක්ෂ විසි පන් දහස් හයසිය අසූ එකයි ශත අනූ පහක (රු. 3,425,681.95) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2013.11.22 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2013.10.31 වැනි දින "දිවයින" සහ " තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2015.07.10 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර හා සීමාවන් තුළ මොරටුවැල්ල පිහිටි ෆ්‍රේසර් ඇවනිව් වරිපනම් අංක 27 දරන "පයුරුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයත් මානක තැන ඩබ්ලිව්. ඕ. ජේ. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1991 ජූලි 26 දාතම හා අංක 3597 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1 ඒ වශයෙන් ලකුනුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ෆ්‍රේසර් ඇවනිව් නැගෙනහිරට : වරිපනම් අංක 25 දරන පරිශ්‍රයන් දකුණට : එම ඉඩමේ ලොට් 1 බී සහ බස්නාහිරට : බලයලත් මානක තැන ටී. සී. ආර්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1969 මාර්තු 11 දාතම හා අංක 22 දරන පිඹුරේ ලොට් 3 හි මාර්ග පිවිසුම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම හයයි පහක් (අ. 0, රූ. 0, පර්. 11.65) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 3597 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව එම් 3126/01 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ඒ දිගේ ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව එම් 915/52 යටතේ ලියාපදිංචි කොට ඇති හා බලයලත් මානක තැන ටී. සී. ආර්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1969 මාර්තු මස 11 දාතම හා අංක 22 දරන පිඹුරේ ලොට් 3.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

06-554

---

**කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී - ගලේවෙල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහනුවර පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වත්තේගම සුළු නගර සභා සීමාවන් තුළ වත්තේගම ගමේ වත්තේගම- මහනුවර මාර්ගයට මායිම්ව පිහිටි ඉතා වටිනා ව්‍යාපාරික ගොඩනැගිල්ල ඇතුළු අනෙකුත් සියලු දේ. (නුවර පාර වරිපනම් අංක 238 සහ 240 දරන දේපළ) ඉඩමේ ප්‍රමාණය : පර්චස් 20.48.

මෙම දේපළ වත්තේගම නුවර පාර හි පිහිටි දුම්බර එන්ටප්‍රයිසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ බන්ධනදායි වශයෙන් හා මද්දුම වේරළගේ කුසුමාවතී යන අය උකස්කරු වශයෙන් කොමර්ෂල් බැංක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.*- වත්තේගම නගරයේ සිට මහනුවර මාර්ගයේ මීටර් 750ක් පමණ ගමන් ගත් විට මෙම පාරේ දකුණු පසින් අදාළ දේපළ පිහිටා ඇත. (දුම්රිය හරස් මාර්ගයට ඉතා සමීපව)

2015 ක් වූ ජූලි මස 08 වැනි දින පෙ.ව. 10.00 ට ආරම්භ වන වෙන්දේසියේ දී මා විසින් විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2015.05.22 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2015.05.08 වැනි දින ද අයිලන්ඩ්, ලක්බිම හා තිනකුරල් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ :-

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳශා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියළුම ප්‍රචාරක වියදම් ද,ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අංක 49/57, මාතලේ පාර, ගලේවෙල.

දුරකථන අංක : 066 2287237, 066-2287238, 066 - 2289351.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක :071-4755974/071-8446374/077-7761706.
දුරකථන අංක/ෆැක්ස් : 081-2210595

06-560

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.